**ශීර්ෂය - 274 අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සහ ඒසීඒ 5 ආකෘති පත්‍රය ප්‍රකාරව අත්තිකාරම් ලැබීම් රු.74,874,530 ක් වුවත් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ එම අගය රු.103,266,952 ක් ලෙස දැක්වීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම් රු.28,392,422 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අතපසුවීමකින් සිදුව ඇත. | භාණ්ඩාගාර මුද්‍රිත අනුව අදාල මුදල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කලයුතුය. |

**(ආ) ප්‍රධාන ලෙජර් වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ප්‍රධාන ලෙජර් වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව අත්තිකාරම් ගෙවීම් රු.67,653,680 ක් වුවත්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි එකී අගය රු.105,794,116 ක් ලෙස දැක්වීම හේතුවෙන් ප්‍රධාන ලෙජර් වියදම් රු.38,140,436 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අතපසුවීමකින් සිදුව ඇත. | භාණ්ඩාගාර මුද්‍රිත අනුව අදාල මුදල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කලයුතුය. |

**(ඇ) පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් දෙපාර්තමේන්තු විසින් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් දරන ලද රු.4,286,928 ක වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් නොකළයුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි සහ මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දත්ත නිරූපණය කලයුතුයි. |

**(ඇ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන වැය විෂයයන් 05 ක් වෙනුවෙන් දරන ලද රු.199,956,036 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි සහ අනෙකුත් මෙහෙයුම් වියදම් යටතේ දක්වා නොතිබුණි. | රු.199,956,036 තුළ මූලධන වියදම් ඇතුළත් කර ඇති බැවින් පුද්ගල පඩි නඩි සහ අනෙකුත් මෙහෙයුම් වියදම් යටතේ දක්වා නැත. | මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල දත්ත නිරූපණය කලයුතුයි. |

**(ඉ) අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2022 දෙසැම්බර් 31 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.5 වගන්තිය ප්‍රකාරව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වර්ෂ අවසානයේ ශේෂය අග්‍රිම | අතපසුවීමකින් සිදු වී ඇත. | ශේෂ අතර වෙනස්කම් ගැලපුම් කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයේ සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු වුවත් එකී ශේෂ දෙක අතර රු.10,567,936 ක වෙනසක් විය. | | |
| **(ii)** | ගණනය කිරීම් අනුව අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද බැර කිරීම් රු. 10,706,878 ක් වුවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එම අගය රු.38,737,436 ක් ලෙස රු.28,030,538 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් ගිණුම් ගත කලයුතුය. |
| **(iii)** | ගණනය කිරීම් අනුව අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් බී ගිණුමට කරන ලද හර කිරීම් රු.584,500 ක් වුවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එම අගය රු.39,520,000 ක් ලෙස රු.38,935,500 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් ගිණුම් ගත කලයුතුය. |
| **(iv)** | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් රු.39,520,000 ක් වුවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එය රු.10,855,021 ක් ලෙස රු.28,664,979 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් ගිණුම් ගත කලයුතුය. |
| **(v)** | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් බී ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් රු.38,987,436 ක් වුවත් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ එය රු.7,077,272 ක් ලෙස රු.31,910,164 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් ගිණුම් ගත කලයුතුය. |
| **(vi)** | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.7,767,350 ක් වුවත් ACA 3 ආකෘතියේ භාණ්ඩාගාර පොත් අනුව ශේෂය දැක්වීමේ තීරුවේ සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය තිරුවේ එම අගය දක්වා නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ මුදලින් සහ වියදම් මඟින් අග්‍රිම පියවීම් එකතුව භාණ්ඩාගාර මුද්‍රිත අනුව රු.5,637,849,213 ක් වුවත් ACA 3 ආකෘතිය ප්‍රකාරව එම අගය රු.5,645,581,089 ක් වුයෙන් එම ශේෂ දෙක අතර රු.7,731,876 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් ගිණුම් ගත කලයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළු ගල් කැණීම් වෙනුවෙන් රජයේ ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් වන සංරක්ෂක ජනරාල් විසින් නිකුත් කර ඇති 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් ගාස්තු ගෙවීමේ දී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය වෙත රාජ්‍ය භාගය ගෙවන ලද කළු ගල් කියුබ් ප්‍රමාණයන් හා සැසඳීමේදී ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 09 ක කළු ගල් කැණීම් වෙනුවෙන් අයවිය යුතු රජයේ ගාස්තුව රු.147,298,661 ක් විය. | හිඟ ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් නිරන්තරව ලිඛිතව දැනුවත් කිරීම් සිදු කර ඇති අතර අයකිරීම සඳහා ඉදිරියේදී අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට තීරණයකට එළඹීට කටයුතු කර ඇත. | අදාල මුදල් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | බොරළු කැණීම් වෙනුවෙන් රජයේ ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2009 මැයි 06 දිනැති අංක 1600/18 අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 02 ක 2019 සිට 2022 වසරවලට අදාල බොරළු කැණීම් සිදු කර අවසන් කර ඇති පුද්ගලයන් විසින් කැණීම් කරන ලද මුළු කියුබ් ප්‍රමාණයන්ට අදාලව රජයේ ගාස්තු ලෙස රු.10,045,440 ක් අයකරගත යුතුව තිබුණි. | අදාල මුදල් ගෙවන ලෙස පුද්ගලයින් දැනුවත් කර ඇති අතර නොගෙවන්නේ නම් ඒ් සඳහා නීතිමය කටයුතු කරනු ඇත.. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කලයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පදිංචි සහ ගොවිතැන් කටයුතු වල නියැලී ඉඩම් නොමැති අය සඳහා ඉඩම් ලබාදීමට හා දැනට ඉඩම් හිමි එහෙත් නීත්‍යානුකූල අයිතිය නොමැති අය සඳහා විධිමත් බලපත්‍ර ලබාදීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කළමනාකරණය විධිමත් කිරීම සඳහා වූ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමට කටයුතු කළයුතු වුවත් වසර 03 කට හෝ ඊට වැඩි කාලයක සිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 03 ක ග්‍රාම සේවා වසම් 18 ක ඉඩම් කච්චේරි පවත්වා නොතිබුණි. | රට තුළ පැවති අයහපත් සෞඛ්‍ය තත්වයන් හේතුවෙන් ඉඩම් කච්චේරි පැවැත්වීම අවම කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව නිසි කාලවලට ඉඩම් කච්චේරි පැවැත් විය යුතුය. |
| (ආ) | හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ ගාස්තු වශයෙන් 2017 දෙසැම්බර් 31 දින උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙතින් පලුගස්වැව ප්‍රාදේශිය ලේකම් වෙත ලද රු.8,000,000 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මෙම ව්‍යාපෘතිය සක්‍රිය තත්ත්වයේ පවතින අතර මේ වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 4 වන වගන්තිය යටතේ කටයුතු කරමින් ඇත | ඉඩම් පවරා ගැනීම කඩිනමින් කලයුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ කහටගස්දිගිලිය , සහ මැදවච්චිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල ප්‍රතිලාභින් 287 දෙනෙකුට රු.7,099,111 ක් වැය කර කිකිළි පැටව් 21,261 ක් බෙදා දී | කහටගස්දිගිලිය කොට්ඨාසයේ සමස්ථ ප්‍රගතිය 78% ක් පමණ වන අතර මැදවච්චිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභින් 112 දෙනෙකු වෙළඳපල වෙත බිත්තර | ශක්‍යතා අධ්‍යනයකින් පසුව ප්‍රතිලාභින් නිවැරදිව හඳුනාගෙන කොන්දේසි සහිතව ගිවිසුම්වලට එළඹ සුදුසු කාලයන්වලදී |

| | | |
|---|---|---|
| තිබුණු අතර ඉන් කිකිළි පැටවි 12,441 හෙවත් 58% ක් මිය ගොස් තිබුණු බැවින් වැඩ සටහනේ අපේක්ෂිත ප්‍රතිලාභ ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | අලෙවි කරනු ඇත. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු අතර අඛණ්ඩව පසු විපරම් කටයුතු සිදු කලයුතුය. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වනිතා සංවර්ධන නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය මඟින් ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රම 06 කට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 2,833,192 ක මුදලක් වසර 03 ට වඩා වැඩි කාලයක සිට දිගින් දිගටම හිඟ ණය ලෙස පැවතුණි. | මෙම හිඟ ණය ශේෂයන් අයකරගැනීමට කටයුතු කරන අතර අය නොවන ඇතැම් ණය බොල් ණය ලෙස කපා හැරීමට ශ්‍රී ලංකා කාන්තා කාර්යංශයට ඉල්ලීම් ලිපි යවා ඇත. | හිඟ ණය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කලයුතුය. |
| (ආ) | ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කෘෂි කාර්මික කටයුතු හා නේවාසික කටයුතු සඳහා ලබාදී ඇති දීමනා පත්‍ර හිමිකරුවන් විසින්, විවිධ සමාගම් වෙත සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරිම සඳහා එම ඉඩම්වලින් කොටසක් බැහැර කර ඇති අවස්ථාවලදී, 2020 පෙබරවාරි 06 දිනැති අංක 2020/02 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍රවල පසු කටයුතු මැයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව අදාල දීමනා පත්‍ර රජයට භාරගෙන ඉහත කී චක්‍රලේඛයේ VI කොටසෙහි උපදෙස් අනුව කටයුතු කළයුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 ක එවැනි ඉඩම්වල පවතින සන්නිවේදන කුළුණු 126 ක් සම්බන්ධයෙන් ඉහත කී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල දීමනා පත්‍ර රජයට භාරගෙන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට ගොනු ආරම්භ කර කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජනාධිපතිතුමා විසින් අත්සන් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් වෙත එවා තිබූ දීමනා පත්‍ර 1636 ක් ලියාපදිංචි කර අදාළ හිමිකරුවන් වෙත භාරදී නොතිබුණු අතර දීමනා පත්‍ර ලැබී තිබූ කාල පරාසය වසර 01 ත් 14 ත් අතර විය. | මුදල් ගෙවීමට ඇති අපහසුතාව, පදිංචිය හැරයාම, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබීම, තොරතුරු සොයා ගත නොහැකි වීම, රක්ෂිත කලාප වල පිහිටා තිබීම, වෙනත් පාර්ශවයන් විසින් භුක්ති විඳීම, වෙනත් දීමනා පත්‍ර නිකුත් කර තිබීම, දීමනා පත්‍ර සහිත ඉඩම තුළ භුක්ති කරුවන් කිහිප දෙනෙකු සිටීම යනාදී කරුණු හේතුවෙන් දීමනා පත්‍ර මුල් හිමිකරුවන් වෙත භාර දීම ගැටළු සහගත වී ඇත. | දීමනා පත්‍ර ප්‍රතිලාභීන් වෙත කඩිනමින් ලබාදීමට කටයුතු කලයුතුය. |
| (ඇ) | වී මිලදී ගැනීම සඳහා වසර 2001 ත් 2006 ත් කාලසීමාව තුළ භාණ්ඩාගාරය විසින් ලබාදුන් අත්තිකාරම් මුදලින් තවදුරටත් පියවිය යුතු ශේෂය රු. 32,247,247 ක් විය. | ශ්‍රී ලංකා සමූපකාර සංගමයෙන් අයවිය යුතු රු.3,485,983 ක මුදල සඳහා වාර්තාවක් ලබා ගැනීමටත් ගොවිජන දිස්ත්‍රික් කාර්යාලයට අදාළව රු.2,120,000 ක් කපා හැරීමටත් ඉල්ලුම් කර ඇත. ගොවිජන සංවර්ධන සභා 02 ක් සහ විවිධ සේවා සමූපකාර සමිති 03 ක් සඳහා නඩු පැවරීමද නොච්චියාගම විවිධ සේවා සමූපකාර සමිතිය ඈවර කිරීමෙන් පසු අයකිරීමටත්, එප්පාවල විවිධ සේවා සමූපකාර සමිතිය වෙතින් වාර්තාවක් ලබා ගැනීමටත් කටයුතු කර ඇත. | අදාල පාර්ශව වෙතින් මුදල් අයකරගෙන භාණ්ඩාගාරයට පියවීමට කටයුතු කළයුතුය. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් තුරුවිල වැවේ වාන සැකසීමේදී යටවන ඉඩම්වලට වන්දි ගෙවීම සඳහා නාච්චාදූව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දින තැන්පත් කර තිබූ රු.613,721 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණු අතර අදාල ප්‍රතිලාභීන් සඳහා එම වන්දි ලබාදීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | තුරුවිල වාන එසවීමේ දී අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමට රුඳවුම් මුදල් ප්‍රමාණවත් නොවන බැවින් ජල සම්පාදන මණ්ඩලය, රත්මලාන වෙතින් ඒ සඳහා ප්‍රතිපාදන ඉල්ලීම් කර ඇත. | වන්දි මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කළයුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 25 ක් තෘතීයික මට්ටමේ පුරප්පාඩු 27 ක් ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 34 ක් සහ ද්විතීයික මට්ටමේ අතිරික්ත 37 ක් විය. | පිළිගනිමි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළයුතුය. |